# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1657/1 - 2010 ජුනි 07 වැනි සඳුදා - 2010.06.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ නෙළුව ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධුරයේ පුරප්පාඩුවක් පිරවීම

මිය යෑම හේතු කොට ගෙන නෙළුව ප්‍රාදේශීය සභාවේ සභිකයෙකුගේ ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

උපුල් ප්‍රියන්ත කුමාර විජේනායක නම් වූ සභිකයා අයත්වන එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට, දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ නෙළුව ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම්ලත් තැනැත්තකු නාමයෝජනා කිරීමට ඉහත කී ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම්ලත් තැනැත්තකු වන බරනිවල ලියනගේ ආනන්ද මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

නෙළුව ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී අන්තෝනි බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, බරනිවල ලියනගේ ආනන්ද මහතා නෙළුව ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ඒ. බී. අයි. ද සිල්වා,  
තේරීම්භාර නිලධාරී,  
නෙළුව ප්‍රාදේශීය සභාව.

2010 මැයි මස 22 වැනි දින,  
මැතිවරණ කාර්යාලය,  
ගාල්ල.

06-471


1A - G 12937— 350 (2010/06)

සැ. යු.- *අති විශෙෂ ගැසට් අංක 1656/1 කාණ්ඩය 1656/45 න් අවසන් වේ.*

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

පක්ෂ සාමාජිකත්වය අහෝසිවීම හේතු කොට ගෙන කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ සභිකයෙකුගේ ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

තොම්මය හේවගේ වීරසේන නම් වූ සභිකයා අයත්වන එක්සත් ජතික පක්ෂය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට, දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම්ලත් තැනැත්තකු නාමයෝජනා කිරීමට ඉහත කී ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම්ලත් තැනැත්තකු වන ඉලන්දාරි දේව සමන්ත කුමාර මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි අන්තෝනි බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, ඉලන්දාරි දේව සමන්ත කුමාර මහතා කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ඒ. බී. අයි. ද සිල්වා,
තේරීම්භාර නිලධාරි,
කරන්දෙණිය ප්‍රාදේශීය සභාව.

2010 මැයි මස 25 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
ගාල්ල.

06-472

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.